# මහනුවර ඩෝසන් කුළුණෙහි සංරක්ෂණ අවශ්‍යතාවය පිළිබඳව සිදු කෙරෙන විමර්ශනාත්මක අධ්‍යනයක්.

*එම්.එස්.එන්. විජේසිරි* [1]

බ්‍රිතාන්‍යයන් විසින් මෙරට ඉදිකළ මුල් ම මහාමාර්ගය වූ කොළඹ-මහනුවර මාර්ගයේ වැඩ කටයුතු අරඹනු ලැබුවේ 1820 වර්ෂයේදීය. වරකාපොළ සිට අඹේපොළ දක්වා වූ සැතපුම් 11ක් පමණ දුර ප්‍රමාණය මේජර් තෝමස් ස්කිනර් යටතේ ද, මාර්ගයේ ඉතිරි සම්පූර්ණ සැතපුම් 36ක ප්‍රමාණය කපිතාන් ඩෝසන්ගේ අධීක්ෂණය යටතේ ද සිදු වීමට නියමිත වූ නමුදු කපිතාන් ඩෝසන් අභාවප්‍රාප්ත වූ බැවින් ඔහු සිහිකරනු වස් බ්‍රිතාන්‍ය පාලකයින් ශ්‍රී ලංකාවේ කඩුගන්නාව පිහිටි කපොල්ල ආසන්නයේ ඉදිකොට තිබෙන ස්මාරකය ඩෝසන් කුළුණ ලෙස නම් කරන ලදී. ඩෝසන් කුළුණ මේ වනවිට යම් හානියකට ලක්වී ඇති ආකාරයක් පෙනෙන බැවින් හානිකාරක මොනවාද යන්න පර්යේෂණ ගැටලුව ලෙස යොදා ගැණුනි. ඩෝසන් කුළුණෙහි හානිකාරක සඳහා ලබාදිය යුතු සංරක්ෂණ පිළියම් පිළිබඳව යෝජනා ඉදිරිපත් කිරීමත් එහි හානිකාරක පිළිබඳව වාර්තාගත කිරීමත් පර්යේෂණ අරමුණ වේ. මේ සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේද භාවිත කරන අතර එහිදී පුස්තකාල අධ්‍යනයන්, ක්ෂේත්‍ර අධ්‍යනයන් සහ පුරාවිද්‍යා සංරක්ෂකයින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තු නිළධාරීන් සමග සම්මුඛ සාකච්ඡා මගින් දත්ත රැස් කරන ලදී. ස්වභාවිකව මෙන්ම මානව ක්‍රියාකාරකම් මත ද නිසි සංරක්ෂණයකින් තොරව ද ඩෝසන් කුළුණ අවදානමක පවතී. නියමිත පරිදි පිළිස්සුණු ගඩොල් භාවිතා නොකිරීම බදාමවල ශක්තියට වඩා අඩු ශක්තියකින් ඇති ගඩොල් භාවිතා කිරීමෙන්ද ස්මාරකය හායනයට ලක්වී ඇත. එමෙන්ම ස්මාරකයෙහි බෝ (*Ficus religiousa*), නුග වැනි ශාක වර්ධනය වීමෙන් ඉරිතැලීම්, ඉදිරියට නෙරා යාමක් සිදුවේ. ඇල්ගී, දිලීර සහ පෙදපාසි හේතුවෙන් අවපැහැ ගැන්වී ඇති බැවින් මෙහි සෞන්දර්යාත්මක අගය විනාශ කරයි.මිනිස් ක්‍රියාකාරකම්වල බලපෑමෙන් ස්මාරකය නැරඹීම තහනම් කළද එය සංරක්ෂණ කටයුතු සඳහා බාධාවක් වේ. ඩෝසන් කුළුණෙහි සිදුවන හානිය වළක්වා ගැනීම සඳහා ස්මාරකයේ අගයන්ගේ වෙනස්කමකින් තොරව අවට ඇති තත්ත්වයන් පාලනය කරමින් එය ආරක්ෂා කර ගැනීම සිදු කළ යුතුය. වර්ෂාව, සුළඟින් සිදුවන හානි වළක්වා ගැනීමට ක්‍රියාකර කොල්ලකෑම් සහ අනෙකුත් මානව හානි වලින් ආරක්ෂා කර ගැනීමට නීතිරීති ක්‍රියාත්මක කිරීම, මුරකරුවන් යෙදවීම සහ ජාතික උරුමයක් සහ ස්මාරකයක් ලෙස ගැසට් කර නඩත්තු කළ හැකිය. එබැවින් මෙය නිසිපරිදි සංරක්ෂණය කරමින් එහි ගැබ්ව පවතින අගයන් ආරක්ෂා කරගත හැකි බව පර්යේෂණයෙහි නිගමනයයි.

***ප්‍රමුඛ පදඃ*** ඩෝසන් කුළුණ, සංරක්ෂණය, හායනය, උරුමය, බ්‍රිතාන්‍ය

[1] ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යනාංශය, රුහුණු විශ්ව විද්‍යාලය. sanduniwijesiri1998@gmail.com